ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2323/21 - 2023 මාර්තු මස 14 වැනි අඟහරුවාදා - 2023.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) 2 වන වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

සබරගමුව පළාත් ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව වන මා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වන රංකොත් පේඩිගේ නොයෙල් දසන්ත ස්ටීවන් මහතා, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමේදී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකර ඇත්දැයි පරීක්ෂා කර බැලීම සඳහා, පත්කරන ලද විශ්‍රාමලත් අධිකරණ නිලධාරියාගේ පරීක්ෂණ වාර්තාව මා හට ලැබී ඇති බැවින්ද, එකී වාර්තාව ප්‍රකාරව රංකොත් පේඩිගේ නොයෙල් දසන්ත ස්ටීවන් මහතා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වගන්තියේ සඳහන් වරදවල්වලට අදාළව ඔහු වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා සියල්ලටම වරදකරු බවට තීරණය කර ඇති බැවින්ද, එකී වාර්තාවේ සඳහන් චෝදනා, සාක්ෂි, තීරණ සහ රංකොත් පේඩිගේ නොයෙල් දසන්ත ස්ටීවන් මහතාට එරෙහිව මා වෙත ඉදිරිපත්ව ඇති චෝදනා, සාක්ෂි හා ලේඛනද මා විසින් නිසි ලෙස පරීක්ෂා කර අධ්‍යයනය කිරීමෙන් අනතුරුව, එකී රංකොත් පේඩිගේ නොයෙල් දසන්ත ස්ටීවන් මහතා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1) වගන්තියේ සඳහන් කර ඇති වරදවල් එකක් හෝ කිහිපයක් සිදු කර ඇති බවට තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට මා සෑහීමකට පත් වූ බැවින්ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වගන්තිය ප්‍රකාරව, මාහට ලැබී ඇති බලතල අනුව මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වන රංකොත් පේඩිගේ නොයෙල් දසන්ත ස්ටීවන් මහතා මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයෙන් හා සභික ධුරයෙන් 2023.03.14 වැනි දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරමි.

ටිකිරි කොබ්බෑකඩුව,
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2023 මාර්තු මස 13 වැනි දින,
රත්නපුර නව නගරයේ පිහිටි,
සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 6258 — 07 (2023/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*